සන්නස SANNASA

# ලියා දක්වන වග

රූපවාහිනිය ගුවන් විදුලිය යන මාධ්‍ය වලට වඩා පුවත් පත වෙනස් වන්නේ එය ඔබට ආලෝකය ඇති ඕනෑම තැනක සිට ඕනෑම වේලාවක රස විඳිය හැකි මාධ්‍යයක් ලෙසිනි. පුවත් පතක වාක්‍යයන් හා ඒවායෙන් තැනෙන අරුත සිතින් මවා ගැනීමේදී ඔබ මනසට ඉතා වටිනා ව්‍යායාමයක් ලැබේ. රූපවාහිනිය ගුවන් විදුලිය මුහුණු පොත වැනි අනෙකුත් මාධ්‍ය තුළින් සංකල්ප ගොඩනැගීමේදී ඔබේ මනසට අමතරව දෙසවන් හෝ දෙනෙත් හෝ ඒ දෙකම ක්‍රියාත්මක වේ.

එබැවින් මනසට ලැබෙන ව්‍යායාමය බෙහෙවින් අඩුය. මේ හේතුව නිසාම කුඩා වියේ පටන් දරුවා පුවත් පත් හා පොත් කියවීමට හුරු කළ යුතුය. වැඩිහිටි අයද පොත පත පුවත් පත මගින් තම සංකල්පනාවන් ඇති කර ගන්නේ නම් ඔවුන්ගේද නිර්මාණ ශක්තිය ඔප් නැංවෙන්නේය. තවද මේ නිසා එක්තරා භාවනාවකට සම වැදුනාක් මෙන් වූ මානසික ව්‍යායාමය නිසා සියළු කාරණා නිරවුල්ව කිරීමේ හැකියාවක් ඇති වන්නේය.

සියළුම අංගයන්ගෙන් සමන්විත වනසේ අප පුවත් පත මේ මාසයේ සිට ඔබට දැනුම, ලංකාවේ පුවත්, විදෙස් පුවත්, විචාර, විනෝදාංශ, සංගීතය, ධර්මය, ආදී විශේෂාංග රැසකින් යුක්ත වනු ඇත. පුවත් පතෙහි රසාලිශ්ඨ භාවය හා ගුණාත්මක භාවය වැඩි දියුණු කර ගැනීමට ඔබගේ අදහස් උදහස් අප වෙත එවන මෙන් ඉල්ලමු. තවද ඔබගේ රසවත් හරවත් නිර්මාණද අප පුවත් පතේ ගුණාත්මක භාවය වැඩි කිරීමට ඉවහල් වනු ඇති බව අපගේ විශ්වාසයයි. අපක්ෂපාතී පුවත් පතක් ලෙස කටයුතු කිරීම අපගේ අරමුණයි.

**සංස්කරණය / Editors**
චිත්‍රාන් මොරකන්දෙ ගමගේ

අනුශාසක / **Advisor**
දෙනගම සිරිවර්ධන මහතා

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by Crystal D**
Digital Agency
www.crystald.com.au

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ
හර්ෂ කසුන්
ශනිල්ක නදීශාන්

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Dilki : 0426 959 540**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:**
Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.




## කීර්ති වර්ණකුලසූරිය

- **බ්‍රිගේඩියර් ප්‍රියංක ප්‍රනාන්දුට එරෙහිව අත්අඩංගුවට ගැනීමේ නියෝගය අහෝසි කෙරෙයි**
- **භයානක රටක්වූ මාලි රාජ්‍යට ශ්‍රී ලංකා සෙබළුන් යැවීම**
- **ඇමරිකානු නාවික හමුදාව කටුනායකට ගෙන ආවේ ලියුම් සහ මෙවලම්ලූ**
- **මේජර් ජෙනරල් ශවේන්ද්‍ර සිල්වාගේ විදේශ සංචාර තහනම් කර ඔහුව අත්අඩංගුවට ගන්නැයි යස්මින් සූකා ජාත්‍යන්තර ප්‍රජාවෙන් ඉල්ලයි**

කටුනායක සිට ඉන්දීය සාගරයේ ස්ථානගතවී සිටින ජෝන් සී ස්ටෙන්නිස් ගුවන් යානා වාහක නෞකාව වෙත භාණ්ඩ ප්‍රවාහනයේදී හමුදා උපාංග සහ හමුදා පිරිස් සම්බන්ධ වී සිටි බව එම නෞකාවේ මහජන කටයුතු භාර නිලධාරිනි ලූතිනන් කමාන්ඩර් ජෙසිකා ඇන්ඩර්සන් අනාවරණය කර ඇත.

එහෙත් මෙරට ඇමරිකානු තානාපතිනි ඇලිනා ටෙප්ලිට්ස් ජනතාව මුළාකරමින් කටුනායකට ගොඩබෑවේ ලිපි, මෙවලම් ඇතුළු වෙනත් භාණ්ඩ බව ප්‍රකාශ කර තිබේ.

මේ භාණ්ඩ කටුනායකට ගෙන ආවේ ඇමරිකානු නාවික හමුදාවට අයත් සී-40 වර්ගයේ ප්‍රවාහන යානාවෙනි. එම භාණ්ඩ කටුනායක සිට ආපසු ජෝන් ස්ටෙන්නිස් නැවට ප්‍රවාහනය කළේ සී-2 B ග්‍රේහවුන්ඩ් වර්ගයේ යානා දෙකකිනි.

බහරේන් නුවර ඇමරිකානු සැපයුම් කඳවුරේ සිට මෙම භාණ්ඩ කටුනායක ගුවන්තොටුපළට ගෙනවුත් එතැන් සිට ස්ටෙන්නිස් නැවට ප්‍රවාහනය කිරීම අබිරහසක් නොවේද?

බහරෙන් සිට කටුනායක ගුවන් තොටුපළට ඇති දුර සැතපුම් 2337 කි. එසේනම් සැතපුම් 2400 ක් එක දිගටම පියාසර කළ හැකි සී 2 B වර්ගයේ ඇමරිකානු නාවික හමුදා යානා දෙකට සෘජුව බහරේන් සිට ස්ටෙන්නිස් නැවට ගොස් ගොඩබෑම නොකළේ මන්ද?

එසේ වුවත් ඇමරිකානු තානාපතිනි කියන්නේ ඇමරිකානු නාවික හමුදාවේ සී-2B යානාවලින් ස්ටෙන්නිස් නෞකාව වෙත ලියුම්ද ගෙනගිය බවයි. මේ ලියුම් එම යෝධ නැවේ සේවය කරන නැවියන් හා නිලධාරින්ටද?
ජෝන් ස්ටෙන්නිස් නෞකාවේ අධිතාක්ෂණික අන්තර්ජාල පහසුකම් තිබියදී නැවියන්ට තම පවුලේ අය ඇමතිය හැකි සන්නිවේදන ජාලයක් ඇති විටෙක එම නැවියන් බහරේන් සිට ලිපි එවනතුරු බලාසිටින්නේද?

ලොව විශාලතම නාවික හමුදා බළකාය ඇමරිකානු ශාන්තිකර කලාපීය සේනාංකයයි. වර්ග සැතපුම් මිලියන 200 ක් පුරා ක්‍රියාත්මක වන මෙම බලගතු නාවුක බළඇණියට යුද නැව් සහ සබ්මැරීන් 200 ක් ගුවන් යානා 1200 ක් සහ නැවියන් 130000 ක් අයත්වේ.

මෙලෙස බහරේන් සිට කටුනායකට භාණ්ඩ ගෙනවුත් එතැන් සිට ස්ටෙන්නිස් යුද නැවට ප්‍රවාහනය කිරීමේ මෙහෙයුමින් ශ්‍රී ලංකාවට ඩොලර් මිලියන 31 ක මුදලක් ලැබී ඇතැයි ඇමරිකානු තානාපතිනිය ප්‍රකාශ කර ඇත.

එහෙත් මේ භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුමට ඉන්දියාව ඉඩ නුදුන්නේ මන්ද?

බහරේන් සිට කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට ගෙන ආ භාණ්ඩ අතර මෙවලම්ද තිබූ බව තානාපතිවරිය පවසා ඇති අතර එම මෙවලම් ස්ටෙන්නිස් නෞකාවේ ඇණ මුරිච්චි තද කිරීමට ගෙන ආ උපාංගදැයි විමසිය යුතුව ඇත.

මෙම භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුමට විදේශ කටයුතු අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය සහ සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව අනුමැතිය දී තිබේ.
එසේම ඇමරිකානු සත්වැනි නාවුක බළඇණියේ ප්‍රකාශක ලූතිනන් ජෝන් කෙලී පවසා ඇත්තේ ඇමරිකානු නාවික හමුදාව භාණ්ඩ මාරුකිරීමේ ක්‍රියාදාමයක් දියත් කළ බවයි. එසේම ඔහු පවසන්නේ මේ මෙහෙයුමෙන් ඩොලර් මිලියන 25 ක් ශ්‍රී ලංකාවට ලැබෙන බවයි. එහෙත් තානාපතිනි ඇලිනා පවසා ඇත්තේ ඩොලර් මිලියන 31 ක් ලැබෙන බවත්ය.

මෙවන් පසුබිමක් මැද ඇමරිකානු සත්වැනි නාවුක බළඇණිය ක්‍රියාත්මක වන්නේ ජපානයේ යොකෝසුකා වරායේයි. එහි යුද නැව් 70 ක්ද ප්‍රහාරක යානා සහ ප්‍රවාහන නැව් 300 ක්ද 40000 ක නාවික බළඇණියක්ද ස්ථානගත වී ඇත. මෙයට අමතරව ඇමරිකානු මැරයින් බළකායක්ද ක්‍රියාත්මක වේ.

මෙලෙස ඇමරිකානුවන් ශ්‍රී ලංකාව තුළ නාවික කඳවුරක් ස්ථාපිත කිරීමට